# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1989/10 - 2016 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා - 2016.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : LND/AQUIS/1/02.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් තබ්බෝව අභය භූමියෙහි පිහිටි පෞද්ගලික ඉඩම වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා පවරා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම් කැබලිවල විස්තරය :*

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 637/3 කරඩිපුවල් ග්‍රාම නිලධාරි වසමේ කරඩිපුවල් ගමෙහි පිහිටි පුත්තලම දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් 2016.04.29 දිනැතිව සකස් කර ඇති FTP 22 මූලික පිඹුරේ කැබලි අංක 8200 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.0090 ක් පමණ වන මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල,

උතුරට: කරත්ත පාර; නැගෙනහිරට: FTP 22 හි කැබලි අංක 1821; දකුණට: FTP 22 හි කැබලි අංක 1826, 1827 සහ 1828; බටහිරට: FTP 22 හි කැබලි අංක 1819

ඉහත සඳහන් ඉඩම් කැබලිවලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ වර්ෂ 2016 නොවැම්බර් මස 30 වැනි දින පෙ.ව. 10.00 ට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2016 දෙසැම්බර් මස 20 වැනි දිනට හෝ ඊට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සංජීවනී හේරත්,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
වනාතවිල්ලුව.

2016 ඔක්තෝබර් මස 11 වැනි දින,<br>
වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 83

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24383 - 17 (2016/10)   ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.